www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇලන් තෝර්නට් විසින් ට්‍රොට්ස්කිවාදය හෙළාදැකීම

## දෙවැනි කොටස

**Alan Thornett's denunciation of Trotskyism**

**ක්‍රිස් මාස්ඩන් විසිනි**
**2008 මාර්තු 21**

*මෙය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝර්ජ් ගැලෝවේගේ රෙස්පෙක්ට් රිනීවල් හෙවත් ගෞරවය යලි පිහිටුවීමේ ව්‍යාපෘතියෙහි ඇලන් තෝර්නට්ගේ ජාත්‍යන්තර සමාජවාදී කන්ඩායමේ භූමිකාව විශ්ලේෂනය කෙරෙන කොටස් දෙකකින් සමන්විත ලිපියක දෙවැනි සහ අවසන් කොටසයි.*

ඇලන් තෝර්නට් විසින් ට්‍රොට්ස්කිවාදයට එරෙහිව එල්ල කරන ලද කර්කශ විවේචනය ඔහුගේ ම දේශපාලනය විකසනය යලි පිරික්සීමට අවස්ථාවක් සපයයි. එය උපදේශාත්මක වන්නේ සමාජවාදය ගොඩනැගීම පිලිබඳව ව්‍යාජ දේශපාලනමය සංකල්පයක්, වරෙක විප්ලවකාරී දේශපාලනයට ආකර්ශනයවූ කම්කරු හා මධ්‍යම පන්තික ස්තරයක් පැහැදිලිව ම දකුනට තල්ලු වී යාමේ ආරම්භක අවස්ථාව එමගින් විදහා දක්වන හෙයිනි. බ්‍රිතාන්‍යයෙහි ලේබර්වාදය සමග කම්කරු පන්තිය ලත් ප්‍රගාඪ අත්දැකීම් හා මෙම දේශපාලන මාරුව එකට වෙලී තිබුනි.

බ්‍රිතාන්‍යයෙහි "ට්‍රොට්ස්කිවාදී කන්ඩායම්වල" ආන්තික වාමවාදය හෙලා දකින විට තෝර්නට් සමාජවාදී කම්කරු ලීගය (එස්එල්එල්) එහි අනුප්‍රාප්තික සංවිධානය වන කම්කරු විප්ලවාදී පක්ෂය (ඩබ්ලිව්ආර්පී) ගැන ඔහු විශේෂ සඳහනක් කරයි. එස්එල්එල්/ඩබ්ලිව්ආර්පීය ලෝක සමාජවාදී වෙබ් අඩවිය පලකරන හතරවැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) කලින් බ්‍රිතාන්‍ය ශාඛාවයි. තෝර්නට්ගේ ප්‍රවනතාවය ඇරඹුනේ 1974 වසරෙහි ඩබ්ලිව්ආර්පීය තුල සිදුවූ බෙදීමකිනි.

කම්කරු හා වෘත්තීය සමිති නිලධරයට එරෙහිව සමාජවාදී කම්කරු ලීගයේ දේශපාලන අරගලයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1960 ගනන්වල දී එම ලීගය වෙත ඇදී ආ සටන්කාමී කම්කරුවන්ගේ සැලකිය යුතු ස්තරයකට අයත්වූයෙකි, තෝර්නට්. කව්ලි හි දැවැන්ත බ්‍රිතාන්‍ය ලේලන්ඩ් මෝටර් රථ කර්මාන්ත ශාලාවෙහි ප්‍රමුඛ සාප්පු සේවකයෙකු වූ තෝර්නට්, කොමියුනිස්ට් පක්ෂයෙන් ඉවත්ව එස්එල්එල් පක්ෂයට බැඳුනි. කර්මාන්ත ශාලාව තුල බොහෝ අරගලවලට ඔහු නායකත්වය දුන්නේ ය. ඔහු කව්ලිහි ප්‍රවාහන හා සාමාන්‍ය කම්කරුවන්ගේ 5/55 ශාඛාවෙහි ද ඒකාබද්ධ සාප්පු සේවකයින්ගේ කමිටුවෙහි ද සභාපති බවට පත් විය. ඔහු එස්එල්එල් පක්ෂයෙහි කාර්මික අංශය වන එක්සත් වෘත්තීය සංගම් සන්ධානයෙහි නායකයා ද විය.

තෝර්නට් එස්එල්එල් පක්ෂයට බැඳුනේ විප්ලවකාරී පක්ෂයක් ගොඩ නැගීම අවශ්‍යයෙන්ම කම්කරු පක්ෂය හා වෘත්තීය සමිති තුල සැලකිය යුතු වාම නැඹුරුවක් වර්ධනය වීමට මං පෑදෙනු ඇතැයි යන වැටහීම තිබූ අවස්ථාවක ය. එවකට කම්කරු පක්ෂයට හා වෘත්තීය සමිතිවලට දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ගේ සහයෝගය ලැබුනි. මේවා සමාජවාදී සංවිධාන යයි ද ඔවුහු විශ්වාස කලහ. කර්තව්‍ය වූයේ කම්කරු පක්ෂ හා වෘත්තීය සමිති තන්ත්‍රයන්හි සමාජවාදී ව්‍යාජයන් එලිදරව් කිරීම සඳහා ක්‍රමානුකූල වැඩ කොටසක් ක්‍රියාත්මක කිරීම ය. එහි අරමුන වූයේ කම්කරු පක්ෂය පිලිබඳව කම්කරුවන් තුල ඇති මුලාවන්ගෙන් ඔවුන් බිඳවීම තුලින් විප්ලවකාරී පක්ෂය වෙත වඩාත් දියුනු කම්කරුවන් ඇදගැනීම ය. මේ අරගලය තුල මිලියන 10ක සාමාජිකයින් නියෝජනය කලා වූ ද ඉතාමත් සක්‍රීය පොදු සාමාජිකයින් සතු වූ ද වෘත්තීය සමිති, දේශපාලන අරගලයෙහි වැදගත් රංගභූමි විය.

තෝර්නට් නායකත්වය දුන් ප්‍රවනතාව, ඉස්මතු වූයේ එස්එල්එල් පක්ෂයේ විරුද්ධත්වය එල්ල වූ එම නිලධාරිවාදී නායකත්වය හා සංවිධානය දෙසට යොමු වූ අවස්ථාවාදී හැඩගැසීමක් වශයෙනි. කම්කරු පක්ෂයේ හා වෘත්තීය සමිතිවල නායකත්වයන්ගෙන් කම්කරුවන් දිනාගැනීමේ දේශපාලන අරගලයක් කර ගෙන යාමට විරුද්ධව, නිලධාරි තන්ත්‍රය තුලින් ම වාම ප්‍රවනතාවක් ඉස්මතු වනු ඇති බවටත් එම වාම ප්‍රවනතාව සමාජවාදය වෙත ඇදී එනු බවටත් ඔහු සංකල්පනය කලේ ය.

බ්‍රිතාන්‍යයෙහි එඩ්වඩ් හීත්ගේ කොන්සර්වටිව් (ටෝරි) පක්ෂයේ ආන්ඩුවට එරෙහිව ප්‍රධාන අරගලවල ස්වරූපය ගත් 1960 ගනන්වල අවසාන භාගයේ හා 1970 ගනන්වල මුල්භාගයේ තියුනු දේශපාලන මාරුවීම් ඇතිවූ කාල පරිච්ඡේදයක් තුල එය තෝර්නට්ගේ ට්‍රොට්ස්කිවාදයෙන් සංවිධානාත්මක හා දේශපාලනමය බිඳී යාමේ ආරම්භක අවස්ථාව විය.

මතවාදී වශයෙන් ගත්කල, තෝර්නට් දිගින් දිගටම වෘත්තීය සමිති සටන්කාමියෙකු විය. එස්එල්එල් පක්ෂය විසින් කරගෙන ගිය අරගලය ඔහු දුටුවේ කව්ලේහි සාප්පු සේවකයෙකු වශයෙන් සිය වැඩකොටසට ප්‍රතිවිරුද්ධව පිහිටි එකක් ලෙස ය. ඔහුගේ වැඩ කොටසෙන් අවධානය යොමු කලේ රැකියා හා සේවා සුරක්ෂිත භාවය සඳහා නොයෙකුත් වාම කම්කරු පාක්ෂිකයන්, ස්ටැලින්වාදීන් හා වාම රැඩිකල් මත දරන්නන් සමග එකට වැඩ කිරීම වෙතය. පසු කලෙක තෝර්නට් මෙසේ ලිවී යඃ "ට්‍රොට්ස්කිවාදය අපට - එවකට ට්‍රොට්ස්කිවාදියෙකු වීමේ අරුත වූයේ සිය තරම හා බලපෑම හේතු කොට ගෙන එස්එල්එල් පක්ෂයේ සාමාජිකයෙකු වීමය - ධනවාදය පිලිබඳව පමනක් නොව, වෘත්තීය සමිති නායකයන් පිලිබඳව ද සමාජය තුල ඔවුන්ගේ භූමිකාව හා හාම්පුතුන් අරබයා සබඳතාව පිලිබඳව ද විශ්ලේෂනයක් සැපයීය."

එසේවුවද, ඔහු තව දුරටත් මෙසේ ලිවී යඃ *"එස්එල්එල් පක්ෂය මෙය පටු මතවාදී අන්තයට ම ගෙන ගියේ ය. පොදුවේ නිලධාරීන් ඉටු කල භූමිකාව එස්එල්එල් පක්ෂය දුටුවේ ඔවුන් සැමට ම එක හා සමානව අදාල වන ලෙස ය. නිලධාරීන් තුල විවිධ කොටස් සිටීමත් ඉන් ඇතැම් කොටස්වලට ප්‍රගතිශීලී භූමිකාවක් ඉටු කල හැකි බවත් දැකීමට එස්එල්එල් පක්ෂය අසමත් විය. එම නිසා මූලධර්ම සම්බන්ධයෙන් ස්ථාවරයක පිහිටා ක්‍රියා කල පිරිස් සමග සන්ධානයක් ගොඩනැගීමට එස්එල්එල් පක්ෂය අසමත් විය."* (අවධාරනය අපේ)

කම්කරු පක්ෂ හා වෘත්තීය සමිති නිලධාරි තන්ත්‍රයට තෝර්නට්ගේ අනුගත වීම ගොඩනැගී ආවේ ජෙරී හීලි, ක්ලිෆ් ස්ලෝටර් හා මයිකල් බන්ඩාගෙන් සමන්විත කේන්ද්‍රීය එස්එල්එල් නායකත්වය තුල වර්ධනය වන දේශපාලන අවමංගතවීමක තත්වයක් තුල ය.

*කම්කරු විප්ලවවාදී පක්ෂය ට්‍රොට්ස්කිවාදය පාවාදුන්නේ කෙසේද?* යන කෘතියෙහි පැහැදිලි කර ඇති පරිදි තෝර්නට්ගෙන් බිඳී යාමේ ක්‍රියාවලිය දිග හැරුනේ 1971 වසරේදී ප්‍රන්ස ඔර්ගනයිසේෂන් කොමියුනිස්තේ ඉන්ටර්නැෂනලිස්තේ ජාත්‍යන්තර කොමියුනිස්ට් සංවිධානය (ඕසීඅයි) සමග පැහැදිලි නොකරන ලද බිඳීයාමෙන් ඇතිවූ තත්වයන් තුලය.

හතරවෙනි ජාත්‍යන්තරය විනාශ වී ඇති බවටත් එය යලි ගොඩනැගිය යුතු බවටත් 1966 තරම් ඈත කලක සිට ඕසීඅයි පක්ෂය අවධාරනය කලේ ය. හජාජාක ට්‍රොට්ස්කිවාදයේ අඛන්ඩතාවය නියෝජනය කලේ ය යන්න ඕසීඅයි පක්ෂය ප්‍රතික්ෂේප කලේ ය. පැබ්ලෝවාදී ව්‍යාපාරයේ දේශපාලනමය දියකරහැරීමේ න්‍යායටත් ස්ටැලින්වාදී සමාජ ප්‍රජාතාන්ත්‍රික හා ධනේශ්වර ජාතිකවාදී පක්ෂවලට අනුගත වීමටත් එරෙහිව ගෙන ගිය අරගලයේ වැදගත්කම ඕසීඅයි පක්ෂය ප්‍රතික්ෂේප කලේ ය. යට කී පක්ෂ සමාජවාදය මුදුන්පමුනුවා ගත හැකි "මොට්ට උපකරන" බවට එය ප්‍රකාශ කලේ ය.

1968 මැයි මස ප්‍රන්ස මහා වැඩ වර්ජනයෙන් පසුව යුරෝපය සොලවාලූ කැලඹිලිකාරී සමාජ හා දේශපාලන අරගලයන්තුල ඕසීඅයි පක්ෂය සැලකිය යුතු තරුන ව්‍යාපෘතිය ගොඩනැගීම ආරම්භ කලේ ය. එනමුදු, එසේ කලේ ප්‍රන්සයෙහි හා ජාත්‍යන්තරව නොයෙකුත් මාධ්‍යමික ප්‍රවනතාවනට අනුගත වීමේ පදනම මත ය. පසුව එය මාධ්‍යමික වාහනය ලෙස ප්‍රන්සයෙහි හතරවැනි ජාත්‍යන්තරය ප්‍රතිසංස්කරනය සඳහා වූ කමිටුව හා කම්කරු පක්ෂය ගොඩනැගීය. ඒ තුලින් ෆෝර්ස් උව්රියර් වෘත්තීය සමිතිය තුල ඕසීඅයි පක්ෂය ප්‍රමුඛ ස්ථානයක් තහවුරු කර ගත්තේ ය. 1971 වසරේ දී සමාජවාදී පක්ෂය තුල ලයනල් ජොස්පින් ස්ථානගත කිරීමට වගකිව යුත්තේ ඕසීඅයි පක්ෂයයි. ජොස්පින් පසු කලෙක, 1981 වසරේ සිට 1995 වසර දක්වා ප්‍රන්සයේ ජනාධිපති ධුරය දැරූ සමාජවාදී පක්ෂයේ නායක ප්‍රන්සුවා මිතරොංගේ ප්‍රධාන සහකරුවකු විය. ඊටත් පසුව, ජොස්පින් ප්‍රන්සයේ අගමැතිවරයා විය.

ඕසීඅයි පක්ෂයට එරෙහිව, පරිපූර්න දේශපාලන අරගලයක් ගෙනයාමට එස්එල්එල් අසමත් විය. ඒ වෙනුවට හජාජාක එවකට ප්‍රන්ස ශාඛාවේ සිටි කාඩර්වරුන්ට කරුනු පැහැදිලි කර පක්ෂයේ නායකත්වයෙහි මාධ්‍යමික ඉදිරිදර්ශනයෙන් ඔවුන් කඩා යටත් කර ගැනීමට සැබෑ ප්‍රයත්නයක් දැරීමටත් ප්‍රථමයෙන් එස්එල්එල් පක්ෂය ඕසීඅයි වෙතින් බිඳී යාමත් 1971 නොවැම්බර් 24 වෙනි දින ප්‍රසිද්ධියේ ප්‍රකාශ කලේ ය. මෙහි අරුත වූයේ එවැනිම මාධ්‍යමික අපසරනයක ප්‍රඵලයක් වශයෙන් තෝර්නට්ගේ ප්‍රවනතාව ඉස්මතු වී එය ඕසීඅයි විසින් එල්ල කල දේශපාලනමය ප්‍රතිප්‍රහාරයක ඍජු උපකරනයක් බවට පත්වූ විට එයට මුහුන දීමෙහි ලා එස්එල්එල් පක්ෂය දේශපාලන වශයෙන් නිරායුධ කොට හා දුර්වල කොට තිබුනු බවයි.

1973 වසරේ දී, කම්කරු විප්ලවවාදී පක්ෂය බවට පත්වීම සඳහා එස්එල්එල් පක්ෂය ව්‍යාපාරයක් දියත් කිරීමට තීරනය කලේ ය. නව පක්ෂයේ ආරම්භක ලියවිලි එස්එල්එල් පක්ෂයේ ට්‍රොට්ස්කිවාදී පරිසරයෙන් ප්‍රධාන කොටම ඉවතට හැරීමක් නිරූපනය කලේ ය. එසේ වූයේ සටන්කාමී ටෝරි විරෝධී ව්‍යාපාරය තියුනුම අවස්ථාවට පැමිනි තත්වයන් යටතේ ය. නව පක්ෂයේ ප්‍රකාශිත අරමුන වූයේ "නිශ්චිත දේශපාලන කර්තව්‍යයක් සපුරාලීම යඃ සමාජවාදී වැඩ පිලිවෙලක් යටතේ කම්කරු පක්ෂය එක්සත් කොට ටෝරි ආන්ඩුව පලවා හැර ඒ වෙනුවට කම්කරු පක්ෂයයේ ආන්ඩුවක් ආදේශ කිරීමයි."

මේ අනුව නව පක්ෂය බොහෝ සෙයින් නිර්වචනය වූයේ, ට්‍රොට්ස්කිවාදයේ ඓතිහාසික උරුමය හා ජාත්‍යන්තර සමාජවාදී වැඩපිලිවෙල වන ධනේශ්වරය පෙරලා දමා කම්කරු බලය ස්ථාපිත කර බ්‍රිතාන්‍යයෙහි හා ජාත්‍යන්තරව සමාජවාදය ගොඩනැගීම මත පදනම්ව කම්කරු පන්තිය මෙහෙයවීමේ මූලෝපායික අරමුන මුදුන් පමුනුවාගැනීම සඳහා යාන්ත්‍රනයක් වශයෙන් නොව, ඡන්ද දායකයන් ඉලක්ක කොට ගත් උපක්‍රමික ප්‍රතිපත්තියක් වශයෙනි.

සමාජවාදී ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ප්‍රතිඥා දුන් කම්කරු පක්ෂ ආන්ඩුවක් ආපසු බලයට ගෙන ඒම සඳහා ඉල්ලීම, වෙනම ගත් කල නිවැරදි ය. එමගින් කම්කරු පක්ෂ හා වෘත්තීය සමිති නිලධාරි තන්ත්‍රයට එරෙහිව දේශපාලනමය අරගලයක අත්දැකීම කම්කරුවන්ට ලබා දීමේ හැකියාව සැපයුනි. හීත්ගේ ටෝරි ආන්ඩුවට එරෙහිව කම්කරු පන්තිය විසින් දියත් කරන ලද ප්‍රහාරයන් හේතු කොට ගෙන කම්කරු පක්ෂය බලයට පත්වීමේ තත්වයක් තුල හැරල්ඩ් විල්සන්ගේ නව කම්කරු පක්ෂය ප්‍රධාන සමාජ ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කරනු ඇතැයි දස ලක්ෂ සංඛ්‍යාත වැඩ කරන ජනතාව බලාපොරොත්තු ඇති කරගන්නා බවට එස්එල්එල්/ඩබ්ලිව්ආර්පී පක්ෂය අපේක්ෂා කලේ ය. ඊලඟට ඔවුන් කම්කරු පක්ෂය සමග ගැටුමකට එලැඹෙනු ඇති අතර මේ මගින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සමග දේශපාලන පලිගැනීමකටත් විප්ලවකාරී පක්ෂය ගොඩනැගීමටත් යහපත්ම විභව තත්වයන් නිර්මානය කරනු ඇත.

"කම්කරු පක්ෂ ආන්ඩුවක් යටතේ සමාජවාදී ප්‍රතිපත්ති" වෙනුවෙන් පසුව සිදුවන අරගලය හේතු කොට ගෙන මාක්ස්වාදය වෙත "දහස් ගනන් ජනයා දිනා ගැනීමටත් වෘත්තීය සමිති හා කම්කරු ව්‍යාපාරයේ ප්‍රතිසංස්කරනවාදී නායකයන් පලවා හැරීමටත් පක්ෂයට අවස්ථාව උදාවනු ඇති" බවට ඩබ්ලිව්ආර්පී (කවිප) ආරම්භක ලියවිල්ලෙන් කියැවුනි.

එසේ වුවද, එස්එල්එල්/ඩබ්ලිව්ආර්පී කම්කරු පන්තිය තුල ඉඩ දිය නොහැකි අන්දමේ ප්‍රතිසංස්කරනවාදී මුලාවන්ට අනුගතවී තිබුනි. ඩබ්ලිව්ආර්පීය හරාත්මකව මැතිවරනය මුල් කොට ගත් වැඩ පිලිවෙලක් ඉදිරිපත් කලේ ය. එහි පක්ෂයේ ට්‍රොට්ස්කිවාදී ස්වභාවය, ජාත්‍යන්තර ඉදිරිදර්ශනය හා හජාජාක දේශපාලන අධිකාරිය සම්බන්ධයෙන් කර තිබුනේ ඉතාමත් අවම මට්ටමේ සඳහනක් පමනි. එහි සැකිල්ලක් සේ දක්වා තිබුනු ඉල්ලීම් සම්බන්ධ වැඩපිලිවෙල සකසා තිබුනේ සේවා නියුක්තිය වඩා ඉහල ජීවන තත්වයක් සමාජමය සහන, වඩාත් හොඳ නිවාස, අනිර්දිෂ්ට අන්දමකට පද්ධතිය වෙනස් කිරීම වෙනුවෙන් "මූලික අයිතිවාසිකම්" පෙලක් වශයෙනි. පොදු ජනයා බඳවාගැනීමට දියත්කල ව්‍යාපාරයට අවශ්‍යවූයේ මේ වැඩපිලිවෙලට එකඟත්වය පල කිරීම පමනි. මෙහි අරුත වූයේ ප්‍රතිසංස්කරනවාදයෙන් දේශපාලන වශයෙන් නොබිඳුනු මාක්ස්වාදීන් වශයෙන් සිය දේශපාලන අධ්‍යාපනය අතින් ආරම්භක අවස්ථාවේ සිටි කම්කරුවන් පක්ෂයට ගලා ඒමට ඉඩ සැලසීම ය.

ඉන්පසු සිද්ධීන් වර්ධනය වූයේ ඩබ්ලිව්ආර්පීය අපේක්ෂා කල ආකාරයට වඩා සංකීර්න හා දිග් ගැස්සුනු අන්දමකට ය. කම්කරු පන්තිය කම්කරු පක්ෂ ආන්ඩුව සමග ගැටෙනු ඇතැයි පක්ෂය පල කල අනාවැකිය නිවැරදි ය. (1978-1979 වසරවල "අසහනයේ ශීත ඍතුව" තුල කම්කරු පක්ෂ ආන්ඩුව විසින් බලෙන් පටවන ලද වැටුප් කැපි කිරීමට එරෙහිව රාජ්‍ය හා පෞද්ගලික අංශ හරහා ඇතිවුන වැඩ වර්ජන ක්‍රියාවලියේ ප්‍රතිඵලය වූයේ වැඩ කරන දින මිලියන 30ක් අහිමි වීමයි.) එනමුදු ටෝරි පක්ෂයට එරෙහි සටන්කාමී ව්‍යාපාරයෙහි අඛන්ඩ ව්‍යාපෘතියක් ලෙස එය කම්කරු පක්ෂ ආන්ඩුවට එරෙහි ව්‍යාපාරයක් වශයෙන් වර්ධනය වනු ඇතැයි උපකල්පනය කිරීම වැරදිය.

"රට පාලනය කරන්නේ කවුරුන්ද? ආන්ඩුවද? වෘත්තීය සමිතිද?" යන සටන්පාඨය යටතේ 1974 මැයි 3 වැනි දින හීත් මහා මැතිවරනයක් කැඳවා තිබුනි. ඩබ්ලිව් ආර්පීය ඇරඹීමෙන් මාස 4ක් වැනි කෙටි කාලයකට පසුව කම්කරු පක්ෂය බලයට පත්විය. එනමුදු, ඒ සුලුතර පාරිපාලනයක් ලෙසිනි. කම්කරු පක්ෂයේ ජයග්‍රහනය මුලින්ම ඇති කල බලපෑම වූයේ එම පක්ෂය හා ප්‍රතිසංස්කරනවාදය කෙරෙහි තිබූ මුලාවන් දුර්වල කිරීම නොව, ශක්තිමත් කිරීමය. මේ බලපෑම ඩබ්ලිව්ආර්පීයට අලුතින් බඳවාගන්නා ලද කම්කරුවන් මත ද දක්නට ලැබුනි.

විශේෂයෙන් ගල්අඟුරු පතල්කරුවන්ට විල්සන් සැලකියයුතු වැටුප් වාසි ලබාදීමෙන් පසුව තමන් බලයට පත් කල විල්සන් ආන්ඩුවට එරෙහිව වහාම අරගලයක් ගෙනයෑමට කම්කරු පන්තිය දේශපාලන වශයෙන් සූදානම්ව නොසිටියේ ය. ආන්ඩුවට අභියෝග එල්ල කිරීම සම්බන්ධයෙන් මුනිවත රැකීම සම්මිශ්‍රනය වූයේ කම්කරු පක්ෂ ආන්ඩුවේ සුලුතර තත්වය හා ටෝරි පාක්ෂිකයන් නැවත බලයට පත්වේ ය යන උත්සුකයන් සමග ය. එම වසරේ ඔක්තෝබර් 11 වැනි දින මැතිවරනයක් කැඳවීමට විල්සන්ට බල කෙරින. එහිදී කම්කරු පක්ෂය ලැබූ ඡන්ද ප්‍රමානය වැඩි වූ අතර එයට පාර්ලිමේන්තුවේ බහුතර බලය ද හිමිවුනි.

කම්කරු පන්තිය තුල කම්කරු පක්ෂය සම්බන්ධයෙන් තිබූ මුලාවන්වල ප්‍රබලතාව ඩබ්ලිව්ආර්පීය පැහැදිලිව ම අවතක්සේරු කර තිබුනි. මෙම වර්ධනයන් හේතු කොට ගෙන සිය ට්‍රොට්ස්කිවාදී අනන්‍යතාවය මත හා කම්කරු පක්ෂයේ හා වෘත්තීය සමිතිවල නිලධාරි තන්ත්‍රය කෙරේ සිය ඓතිහාසික

විරෝධතාව මත යලි පනගන්වන ලද අවධාරනයක් කිරීමට ඩබ්ලිව්ආර්පීය ට බල කෙරින. එනමුදු, මෙය තෝර්නට්ගේ දරුනු විරෝධයට ලක් විය. කම්කරු පක්ෂ හා වෘත්තීය සමිති නිලධාරි තන්ත්‍රයට එරෙහි සිය අරගලය වඩාත් ගැඹුරු කිරීමට ඩබ්ලිව්ආර්පීය දැරූ ප්‍රයත්නයන් කෙරෙ තෝර්නට් දැක්වූයේ දක්ෂිනාංශික ප්‍රතිචාරයකි.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පසුව පැහැදිලි කල පරිදි "1973-74 කාල පරිච්ඡේදයේ මාධ්‍යමික මූලික අයිතිවාසිකම් අපසරනයන් මත පදනම්ව තෝර්නට් ඇතැම් කම්කරු කොටස් සමග සමීප සබඳතාවක් ගොඩනගාගෙන තිබුනි. කම්කරු පක්ෂ ආන්ඩුවට යලි වතාවක් තියුනු ප්‍රහාර එල්ල කිරීමට ඩබ්ලිව්ආර්පී නායකත්වය ඉදිරිපත්වීම ගැන දැන් තෝර්නට් විරෝධය පලකලේ ය. ඒ විශේෂයෙන්ම කම්කරු පක්ෂ ආන්ඩුවේ බලය අවදානම් සහගත වීමත් නව මැතිවරනයක් කැඳවීමේ ආසන්නයටම ගමන් කරමින් තිබීමත් නිසා ය.

ඩබ්ලිව්ආර්පී නායකත්වය කම්කරු ආන්ඩුව අරබයා "පටු මතවාදී" වූයේය යන තෝර්නට්ගේ දැක්ම හැඩ ගැස්සීමට තුඩුදුන් අමතර සාධකයක් වූයේ බ්‍රිටිෂ් ලේලන්ඩ් සමාගමේ අනාගතය අන්තරාදායක වීම හා එම සමාගම යැපුනේ විල්සන් ආන්ඩුවේ සහාය මත වීමය. බ්‍රිටිෂ් ලේලන්ඩ් සමාගම සිය ප්‍රක්ෂේපිත පාඩුව රන් පවුම් මිලියන 16.6ක් බව 1974 වසරේ දී නිවේදනය කලේ ය. එය රන්පවුම් මිලියන 150ක අයිරා පහසුකමක් ඉල්ලා සිටි අතර ඒ සම්බන්ධයෙන් කම්කරු පක්ෂ ආන්ඩුවේ වෙලඳ හා කර්මාන්ත දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා පැවැත්වීය. දෙසැම්බරයේ දී පාර්ලිමේන්තුවේ දී කථා කල කම්කරු පක්ෂයේ ටෝනි බෙන් උදක් බල කර සිටියේ බ්‍රිටිෂ් ලේලන්ඩ් සමාගම ප්‍රමුඛ පෙලේ අපනයනකරුවෙක් හා දැවැන්ත සේවායෝජකයෙක් නිසා එයට සහාය වීම සඳහා ආන්ඩුවේ මුදල් උපයෝගි කර ගැනීම අත්‍යවශ්‍ය බවය. එයට එකඟත්වය ලැබුනි.

## ඕසීඅයි හි භූමිකාව

පක්ෂය සම්බන්ධයෙන් තෝර්නට්ගේ පොදු අසහනය ද එය වමට හැරීම පිලිබඳව ඔහුගේ විරුද්ධත්වය ද බ්‍රිතාන්‍යයෙහි ඕසීඅයි සහායකයින් විසින් කරන ලද දේශපාලනමය ඇවිටිලිකිරීම් පිලිගන්නා තත්වයකට ඔහු ගෙන ආවේ ය. මේ ඕසීඅයි සහායකයන් සංවිධානය වී සිටියේ මාක්ස්වාදී නිවේදක කන්ඩායමෙහි හෙවත් මාක්සිස්ට් බුලටින් ගෲප්හි ය. එහි නායකත්වය දැරුයේ එස්එල්එල් පක්ෂයට ද්‍රෝහි වූ මධ්‍යම පන්තිකයන් දෙදෙනකු වන රොබින් බ්ලික් හා මාක්ස් ජෙන්කින්ස්ය. පසු කලෙක විවෘත කොමියුනිස්ට් විරෝධී කඳවුරට එක්වුනු මේ දෙදෙනාගේ අභිප්‍රාය වූයේ නායකත්වයෙන් ජෙරී හීලි ඉවත් කිරීමේ ආරම්භක ඉලක්කය ඇතිව ඩබ්ලිව්ආර්පීය තුල කල්ලියක් නිර්මානය කිරීමයි. හජාජාක දියකර හැරිය යුතුය යන ඕසීඅයිහි ස්ථාවරයට ඩබ්ලිව්ආර්පීය නම්මවා ගැනීම කරා මෙය එක් පියවරක් පමනක් වනු ඇතැයි සලකන ලදී.

ඩබ්ලිව්ආර්පීයේ බටහිර කලාප මධ්‍යම කාරක සභික කේට් බ්ලේක්නිගේ මාර්ගයෙන් අගෝස්තු මාසයේ දී බුලටින් කන්ඩායම තෝර්නට් සමග සබඳකම් ඇති කර ගත් අන්දම ගැන 1980 වසරේදී බ්ලික් ලිවීය. තෝර්නට් වටා ගෙතුනු "නොනිලවූ ද රහස්‍යවූ ද ප්‍රතිවාදී කන්ඩායමක් පවතින බව" බ්ලේක්නි ඔවුන්ට පවසා ඇත. "ඩබ්ලිව්ආර්පීයට වැරදුනේ කොතැන ද යන්න ගැන මේ කන්ඩායමට පැහැදිලි එකඟතාවක් හෝ වැටහීමක් නොතිබුනි. ඒ වෙනුවට *එය නොයෙක් හේතූන් මුල් කරගෙන ඩබ්ලිව්ආර්පීයේ ජාතික ක්‍රියාකාරිත්වය ගැන නොසතුටට පත්වූ පිරිසකගේ එකතුවක් විය.*" (අවධාරනය අපේ)

ඇලන් තෝර්නට්ගේ පලමු විරෝධතා ලිපියෙහි "සැලකිය යුතු කොටස්" තමා ලියූ බව බ්ලික් කියා සිටී. මෙයට "සංක්‍රමන වැඩපිලිවෙල, කම්කරුවන්ගේ පාලනය, සංගතවාදය හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ කොටස් ඇතුලත් විය." තවද, දිනපතාම පාහේ ඔහු තෝර්නට් සමග හවුල් විය. "ප්‍රතිවාදී කන්ඩායම පහ කරන තෙක් සහ පහ කෙරුනු කාලය තුල" ඔහු තම වාර්තා සැකසීය.

වෘත්තීය සමිතිවල හා කම්කරු පක්ෂයේ සමස්ත නායකත්වය ම "සම්මුතිවාදීන්" ලෙස හඳුන්වාදීමේ ඩබ්ලිව්ආර්පීයෙහි ස්ථාවරයට විරෝධය පෑමට මේ කොටස්වල වැඩි අවධානය යෙදී ය. තෝර්නට්ගේ පක්ෂයේ ප්‍රකාශිත ප්‍රතිපත්තිය කියා පෑවේ තෙවැනි කාල පරිච්ඡේදය තුල ස්ටැලින්වාදීන් විසින් සමාජප්‍රජාතන්ත්‍රවාදීන්, සමාජ ෆැසිස්ට්වාදීන් ලෙස හඳුන්වා දීමට මෙය සමාන වන බවයි.

තෝර්නට්ගේ දක්ෂිනාංශික මාධ්‍යමික ස්ථාවරයන් පිලිබඳව ඩබ්ලිව්ආර්පීයෙහි දේශපාලන විවේචනය නිවැරදි විය. පරදුවට තැබුනු දේශපාලන ගැටලු සම්බන්ධයෙන් පක්ෂයට හා කම්කරු පන්තියට පූර්න වශයෙන් කරුනු පැහැදිලි කිරීමට මත්තෙන් ඕඅයිසීය සම්බන්ධයෙන් සංවිධානාත්මක පියවර ගැනීමේ වැරැද්ද යලිත් සිදු කල හීලි එය වඩාත් සංකීර්න කලේ ය.

හීලි ගත් එම පියවරට නිශ්චිතව ම එක් හේතුවක් වූයේ තෝර්නට්ගේ ප්‍රකෝපකාරී හා ද්‍රෝහී හැසිරීම යි. තෝර්නට් ඕසීඅයි සමග ක්‍රියාකරන බවට හීලිගේ උපකල්පිතය නිවැරදි බව ඔප්පු කිරීමට වැඩි කල් ගියේ නැත. එනමුදු, මෙම සාධාරන සැකය තෝර්නට්ගේ දේශපාලනයෙන් මතු කරන ලද අත්‍යවශ්‍ය න්‍යායාත්මක ගැටලු පිරික්සීමේ අවශ්‍යතාවය

ඉවත දැම්මේ නැත. එහි අරුත වනුයේ ඕසීඅයි සමග ගැටුම යලි නිරීක්ෂනය කිරීම හා එමගින් ප්‍රතිසංස්කරනවාදයට එරෙහි හජාජාක අරගලය නව තලයකට ගෙන ඒමයි. මේ ව්‍යාකූලතාව හේතු කොට ගෙන කැඩී වෙන්වීම සිදු විය. තෝර්නට් නෙරපා හැරීමත් සමග ඔහු සමග සාමාජිකයන් සිය ගනනක් පක්ෂය හැර ගියහ. පක්ෂයට ඉතාමත්ම වැදගත් වූ සිය කාර්මික පදනම ද අහිමි විය.

ඩබ්ලිව්ආර්පීයෙන් භේදවීම මගින් තෝර්නට් හා ඔහුගේ ආධාරකරුවන්ට ලේබර් පක්ෂය තුලට " ඇතුලුවී ක්‍රියාකිරීමේ" නිදහස හිමිවූ අතර 1980 ගනන්වල අවසන් භාගය වන තෙක් ශාකා හා ජාතික තලයේ දී සිය වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වය ඔහු දිගටම ගෙන ගියේ ය. - දැන් හැත්තෑ ගනන් වයසැති තෝර්නට්, ඩබ්ලිව්ආර්පීය විසින් නිර්නය කරන ලද දේශපාලන ව්‍යාකූලත්වයන් විකුනා කමින් දශක තුනකට අධික කාලයක් ගෙවා ඇත. මේ අතර සිය සේවාවන් ලබාගැනීමට කැමැත්තෙන් සිටි ඕනෑම ප්‍රතිසංස්කරනවාදී හෝ ස්ටැලින්වාදී නිලධරයෙකුට උපදේශන සැපයීමට යෝග්‍ය ස්ථානයක් ඔහු ස්ථාපිත කර ගත්තේ ය.

ටෝනි බෙන් වටා ගෙතුනු කන්ඩායමක් වූ චෙස්ටර්ෆීල්ඩ් සමාජවාදී ව්‍යාපාරයෙහි ඔහුගේ කන්ඩායම විශේෂයෙන් ක්‍රියාකාරී විය. වසර ගනනාවක් තුල ජාත්‍යන්තර කමිටුවත් සමග එකඟ නොවන හා ඉන් බිඳී ගිය නොයෙකුත් කොටස් යලි කන්ඩායමක් ලෙස ගොඩනැගීමට උත්සුක වීම ඔහුගේ විශේෂ කාර්යභාරයක් විය. එනමුදු, මෙය සිය ට්‍රොට්ස්කිවාදී මවාපෑම් අත්හැර පැබ්ලෝවාදී එක්සත් ලේකම් මන්ඩලයෙහි සිය ස්වාභාවික දේශපාලන නිවහන සොයායාමේ එක් පියවරක් වූවා පමනි. 1991 වසරේදී ඔහුගේ ජාත්‍යන්තර සමාජවාදී කන්ඩායම එක්සත් ලේකම් මන්ඩලයට පක්ෂපාතී කන්ඩායමක් ලෙස පිලිගැනුනි. 1995 වසරේ දී පැවති ලෝක සම්මේලනයෙහි දී එම කන්ඩායම එහි බ්‍රිතාන්‍ය ශාඛාව බවට පත් විය.

සිය මෑතම ලියවිලිවලින් තෝර්නට් පැහැදිලිව ම පෙන්නුම් කොට ඇත්තේ පැබ්ලෝවාදීන් සමග සිය එකතුවීම දැනට තමා ක්‍රියාත්මක කර ඇති ට්‍රොට්ස්කිවාදය ප්‍රතික්ෂේප කිරීම කරා තබන ලද එක් පියවරක් පමනක් බවයි. මෙම වර්ධනයේ ප්‍රතිරාවය හිටපු රැඩිකල්වාදීන් සැලකිය යුතු සංඛ්‍යාවක් අතර දැකගත හැක. ඔවුහු තමන්ගේ කඩතොලුවුනු සහතික කම්කරු හා වෘත්තීය සමිති තන්ත්‍රයෙහි ඉහල තරාතිරම්වල වැඩි වැටුප් සහිත තනතුරුවලට හුවමාරු කරගෙන ඇත.

බ්‍රිතාන්‍ය එස්ඩබ්ලිව්පීය සමග වැඩිමනත් ලිඛිත ප්‍රහාරයක යෙදෙමින් තෝර්නට්, ගැලොවේ වෙනුවෙන් ප්‍රශස්ති ගී ලියයි.

"තවමත් කම්කරු පක්ෂයෙන් බිඳීයාමට හැකියාවක් ඇති ඉතිරිවී සිටින එකම වාම කම්කරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා" ලෙස ද, "මහ ජනයා ඇමතීමේ දී වමේ හොඳම දේශකයා" ලෙස ද, "කම්කරු පන්තියෙන් පිටස්තරව වමේ අන් සියල්ලන්ටම වඩා විශාලතම ඡන්ද දායක පදනමක් ඇති යුද විරෝධී ව්‍යාපාරයෙහි ප්‍රධාන නායකයා" ලෙස ද තෝර්නට් ගැලොවේ හඳුන්වා දෙයි. තව ද, ගැලොවේගේ " දේශපාලනය වාම කම්කරු දේශපාලනයක්" බව තෝර්නට් කියයි. "එනමුදු, ආරම්භයේ සිටම ඔහු රෙස්පෙක්ට් සංවිධානය තුලට ගෙන ආවේ මෙයයි. එනම්, වාම-කම්කරු පක්ෂ දේශපාලනයෙහි අව්‍යාජ කොටසකි."

අවසනදී තෝර්නට් සැලකිල්ලක් දක්වන්නේ මේ කරුන ගැනයː ඕනෑම අව්‍යාජ නව පක්ෂයක් සමාජවාදයට බද්ධ වෛරයකින් පසුවන නොයෙකුත් කම්කරු පාක්ෂික හා ස්ටැලින්වාදී කැබලිතිවලට වාහනයක් බවට පත්වීම සහතික කිරීමය. "කම්කරු පන්ති නියෝජනය පිලිබඳ අර්බුදය සමග පොර බැදීම සඳහා බලවේගයන්ගේ වඩාත් පුලුල් කන්ඩායම් යලි ඒකරාශී කිරීම සම්බන්ධයෙන් වෘත්තීය සමිති වාමාංශිකයින් හා බ්‍රිතාන්‍යයෙහි කොමියුනිස්ට් පක්ෂය වැනි අනිකුත් වාමාංශික කොටස් කරා ප්‍රවිෂ්ටවීම ඉතා වැදගත් ලෙස සැලකීම රෙස්පෙක්ට් රිනීවල් සංවිධානයේ ශක්තිය වන්නේය"යි ඔහු ප්‍රකාශ කලේ ය.

© www.wsws.org